# මාසික
# විවරණිකාව

**2010 මැයි**



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

60 වැනි වෙළුම 05 වැනි කලාපය

**2010 මැයි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

| පටුන | | පිටුව |
|---|---|---|


1 වන කොටස - මාසික සිදුවීම් ..... 05

2 වන කොටස - පුවත්පත් නිවේදන - 2010 මැයි ..... 06

1. උද්ධමනය 2010 අප්‍රේල් මාසයේ දී තවදුරටත් පහළ වැටෙයි ..... 06
2. ජාත්‍යන්තර සේවා සපයන්නන් සහ ඔවුන්ගේ සේවා නියුක්තිකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම ..... 07
3. 2010 පෙබරවාරි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය ..... 08 - 09
4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 මැයි ..... 10
5. 2010 මාර්තු මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය ..... 10 - 12
6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) ..... 13

## 1 වන කොටස
# මාසික සිදුවීම්
## 2010 මැයි

### රාජ්‍ය මූල්‍ය අංශය

- තිරිඟු ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රුපියල් දෙකක රේගු බද්දක් නැවත පනවන ලදී.

- වියළි හාල්මැස්සන්, අනෙකුත් අර්තාපල්, බොම්බයි ළූණු, මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, පරිප්පු, මුං ඇට, වියළි මිරිස් සහ ටින් කළ මාළු ආනයනය මත පනවා තිබූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද, පෙර පැවති අනුපාත යටතේ තවත් මාස තුනක කාලයක් දක්වා දීර්ඝ කරන ලදී.

### ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියෙන් (JICA) ලැබුණු ප්‍රදාන

මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්වය මූල්‍යනය කිරීම සඳහා 2010 මැයි 25 වැනි දින ශ්‍රී ලංකා රජය හා ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය අතර ජපන් යෙන් මිලියන 229 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 289) ප්‍රදානයකට අත්සන් තබන ලදී.


## 2 වන කොටස

# පුවත්පත් නිවේදන

## 2010 මැයි

### 1. උද්ධමනය 2010 අප්‍රේල් මාසයේ දී තවදුරටත් පහළ වැටෙයි

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) (2002 =100) ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, 2010 මාර්තු මස පැවැති සියයට 6.3 සිට අප්‍රේල් මාසයේ දී සියයට 5.8 දක්වා අනුයාත දෙවන මාසයටත් පහත වැටුණු අතර, මාර්තු මාසය සමඟ සසඳන විට සියයට 1.0 ක මාසික පහත වැටීමක් වාර්තා කළේය. කෙසේ වුව ද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය මාර්තු මස පැවැති සියයට 3.2 හි සිට අප්‍රේල් මාසයේ දී සියයට 3.4 දක්වා සුළු වශයෙන් ඉහළ නැගිණි. මේ අතර, මූලික උද්ධමනය මාර්තු මස සමඟ සැසඳීමේ දී ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය යන දෙයාකාරයේ ම පදනම් මත පිළිවෙළින් සියයට 6.4 කින් සහ සියයට 7.0 කින් පහත වැටිණි.*




මෙම මාසය තුළ සමස්ත දර්ශකයෙහි පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ම ආහාර සහ මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයෙහි (සියයට -2.0) මිල ගණන් පහළ වැටීම ආයක විය. සහල්, රතු ළූණු, ලොකු ළූණු, පරිප්පු, සීනි, සමහර එළවළු හා මත්ස්‍ය වර්ග, පොල් සහ පොල් තෙල් මිල පහළ යෑම මෙම උප දර්ශකයේ පහළ යෑම කෙරෙහි ආයක විය. කෙසේ වුවද, රෙදිපිළි හා පාවහන් (සියයට 0.15); විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.24) සහ ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු කටයුතු (සියයට 0.02) යන උප කාණ්ඩයන්හි මිල ඉහළ යෑම් දක්නට ලැබුණ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; සෞඛ්‍ය; ප්‍රවාහන; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික සහ අධ්‍යාපන යන උප කාණ්ඩවල මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස් ව පැවැතිණි.

## 2. ජාත්‍යන්තර සේවා සපයන්නන් සහ ඔවුන්ගේ සේවා නියුක්තිකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්

*2010 මැයි මස 07 දින සිට බලපැවැත්වෙන පරිදි ජාත්‍යන්තර සේවා සපයන්නන් සහ ඔවුන්ගේ සේවා නියුක්තිකයන් හට ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට අවසර ලබාදීමට තීරණය කරන ලදී.*

පහත සඳහන් කාණ්ඩයන්ට අයත් ජාත්‍යන්තර සේවා සපයන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ඕනෑම නේවාසික සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් හෝ ඕනෑම නේවාසික පුද්ගලයෙකු සහ ඔවුන්ගේ සේවා නියුක්තිකයන් මෙම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට සුදුසුකම් ලබයි.


- ගිණුම් තැබීම, පොත් තැබීම හෝ විගණනය
- බදු උපදේශක සේවා
- සැළසුම් ශිල්පියෙකුගේ සේවාවන්
- ඉංජිනේරු සේවා
- මෘදුකාංග සංවර්ධනය, දත්ත සැකසීම, දත්ත සමුදායන් ගොඩනැගීම හෝ පද්ධති සැළසුම් කිරීම
- ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරන වෙළෙඳ ප්‍රචාරණයන්
- පර්යේෂණ කාර්යයන් සහ වාර්තා ලිවීම
- ඡායාරූපකරණය
- ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරන ග්‍රන්ථ ප්‍රකාශනයන්
- ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරන රූපලාවන්‍ය, හිසකෙස් සැකසීම හෝ නිරූපනය
- ක්‍රීඩකයෙකු හෝ කලාකරුවෙකු විසින් ඉටුකරන සේවාවන්
- තක්සේරුකරුවෙකු හෝ වෙන්දේසි කරුවෙකුගේ සේවාවන්
- ජලනල සවිකරන්නෙකුගේ,පෙදරේරුවෙකුගේ හෝ වඩු කාර්මිකයෙකුගේ සේවාවන්
- ප්‍රමාණ තක්සේරුකරණය
- සෞඛ්‍ය ආරක්ෂක සේවා
- ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි යම් කෘෂිකාර්මික දේපලක් පාලනය කිරීම
- සාමාජිකයින් විසින් පිළිපැදිය යුතු යම් පිළිගත් වෘත්තීමය සම්මතයන් සහිත, සාමාජිකයන් විසින් කරනු ලබන වෘත්තීමය ක්‍රියාකාරකම් පිළිබඳව බලාත්මක කළහැකි සම්මතයන් සහිත වෘත්තීමය ආයතනයක සාමාජිකයෙකු වශයෙන් පුද්ගලයෙකු විසින් ඉටුකරනු ලබන සේවාවන්


මෙම ගිණුම් ජංගම, ඉතිරිකිරීමේ හෝ කාලීන තැන්පතු ආකාරයෙන් ආරම්භ කළ හැකි අතර, මෙම ගිණුම් සඳහා බැර කිරීම් ජාත්‍යන්තර සේවා සැපයීම වෙනුවෙන් බැංකු මගින් විදේශයන්ගෙන් ලැබෙන මුදල්, සේවායෝජකයා වෙතින් විදේශීය මුදලින් ලද සේවක ආදායම් සහ ගිණුමේ ශේෂය මත ගෙවනු ලබන පොලියට සීමා වේ. සේවායෝජකයන් විසින් මෙහෙයවන ලද ව්‍යාපෘති සඳහා සෘජුවම දායක වූ සේවා නියුක්තිකයන්ට මෙම ගිණුම හර කිරීම මගින් බැංකු ප්‍රේෂණ ආකාරයෙන් විදේශ මුදලින් ගෙවීම් සිදු කළ හැක. තවදුරටත්, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්හට අනුමත ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට සිදුකරන විදේශ මුදල් ගෙවීම් ද මෙම ගිණුම හර කිරීම තුළින් සිදු කළ හැක. මෙම ගිණුමෙන් ආපසු ගනු ලබන අන් ඕනෑම මුදලක් ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කළ යුතුය.

මෙම නව ක්‍රියාමාර්ගයන් 2009 අංකඃ 19 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත මගින් අවසර දෙන ලද ආදායම් බදු නිදහස් කිරීම් තුළින් ප්‍රයෝජන ලබාගැනීම පිණිස ජාත්‍යන්තර සේවා සපයන්නන් සහ ඔවුන්ගේ සේවා නියුක්තිකයන්ට උපකාරී වනු ඇත.

## 3. 2010 පෙබරවාරි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය

*ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමග ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාමේ වර්ධනයක් ඇතිවන ලකුණු පෙන්වන ලදී. 2010 පෙබරවාරි මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලයන 629 දක්වා සියයට 20.0 කින් වර්ධනය වූ අතර, මේ සඳහා හේතු වූයේ කෘෂිකාර්මික හා කාර්මික අපනයනවලින් ඉහළ ආදායමක් ලැබීමයි. සියළුම උප අංශවල ආනයන ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් ආනයන වියදම ද එ.ජ.ඩොලර් මිලියන 973 දක්වා සියයට 60.6 කින් ඉහළ යන ලදී. ඒ අනුව 2010 පෙබරවාරි මාසයේ දී වෙළෙඳ ශේෂය එ.ජ.ඩොලර් මිලියන 344 දක්වා පුළුල් විය.*




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

මුළු අපනයනවලින් සියයට 27.0 ක් වූ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2010 පෙබරවාරි මාසයේ දී ඉහළ ගිය අතර, ඒ සඳහා තේ, රබර් සහ සුළු කෘෂිකාර්මික බෝග අපනයන මූලිකත්වය ගෙන ඇත. තේ සහ රබර් අපනයන පරිමාව පිළිවෙළින් සියයට 20.1 සහ සියයට 44.1 බැගින් වර්ධනය වී ඇති අතර ඒවායෙහි ජාත්‍යන්තර මිල අඛණ්ඩව ඉහළ මට්ටමක පවතියි. “සිලෝන් ටී” යන වෙළඳ නාමය යටතේ කරන ලද අපනයනවල පවතින ඉහළ ගුණාත්මකභාවය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තේ සැපයුම අඩුවීම, තේ කිලෝග්‍රෑමයක මිල එ.ජ.ඩොලර් 4.35 දක්වා සියයට 25.7 කින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රධාන වශයෙන්ම, ජාත්‍යන්තර ඉල්ලුම නැවත යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් රබර් කිලෝග්‍රෑමයක මිල එ.ජ.ඩොලර් 2.86 දක්වා වැඩි වූ අතර, එය 2009 පෙබරවාරි මාසය සමග සැසඳීමේ දී සියයට 95.4 ක වර්ධනයකි. ආසියාවේ රබර් නිෂ්පාදනය කරනු ලබන ප්‍රධානතම රටවල්වල පැවැති අයහපත් දේශගුණික තත්ත්වය නිසා ඇති වූ සැපයුම අඩුවීම ද ජාත්‍යන්තර වශයෙන් රබර් මිල ගණන් ඉහළයාමට හේතු විය. පළතුරු, කෝපි සහ කොකෝවා නිෂ්පාදනවල ඉහළ මිල ගණන් සහ එළවළු, පුවක්, කජු සහ සුගන්ධ තෙල් වර්ගවල අපනයන පරිමාව ඉහළයාම හේතුවෙන් සුළු කෘෂිකාර්මික බෝග අපනයන ආදායම ඉහළ යන ලදී. අපනයන පරිමාවන් සහ මිල ගණන් ඉහළ යෑම මූලික කොටගෙන කුරුඳු සහ කරාබුනැටි වැනි සමහර කුළුබඩු වර්ගවල අපනයන ආදායම ඉහළ යන ලදී. ගෝලීය ආර්ථික අර්බුදයේ බලපෑමට ලක් වූ කාර්මික අපනයන, 2010 පෙබරවාරි මාසයේ දී නැවත යථා තත්ත්වයට පත් වූ අතර සකස් කරන ලද ආහාර හා පාන වර්ග මෙන්ම රබර් නිෂ්පාදන අපනයන මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2010 පෙබරවාරි මාසයේ දී රෙදිපිළි හා ඇඟළුම් අපනයන සහ පිඟන් භාණ්ඩ අපනයන පහත වැටුනද, 2010 ජනවාරි මාසයේ සිට එම අපනයනවල වර්ධනයක් පෙන්නුම් කෙරිනි.

2010 පෙබරවාරි මාසයේ දී සෑම ප්‍රධාන කාණ්ඩයකම ආනයන වර්ධනය විය. සහල්, සීනි සහ තිරිඟු ආදී ආහාර ද්‍රව්‍ය ආනයන ඉහළ යාම නිසා පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස වැඩි විය. ආහාරමය නොවන කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ද 2010 පෙබරවාරි මාසයේ දී සැලකිය යුතු අන්දමින් වර්ධනය විය. අන්තර් භාණ්ඩ අතුරින් ඛනිජ තෙල් ආනයන වියදම පෙබරවාරි මාසයේ දී සැලකිය යුතු අයුරින් වර්ධනය වූ අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී බොර තෙල්

බැරලයක සාමාන්‍ය ආනයන මිල එ.ජ.ඩොලර් 78.23 දක්වා සියයට 71.4 කින් ඉහළයාම එයට හේතු විය. පොහොර ආනයන සැලකිය යුතු අන්දමින් ඉහළ යාම හේතුවෙන් 2009 වසරේ එම කාලපරිච්ඡේදය සමඟ සසඳන විට දී 2010 පෙබරවාරි මාසයේ දී පොහොර ආනයන වියදම ඉහළ යන ලදී. අනාගත ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වැදගත්වන ප්‍රවාහන උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර හා උපකරණයන් සඳහා ආනයන වියදම් ඉහලයාම හේතුවෙන් 2010 පෙබරවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම වැඩි විය.

2009 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට 2010 පළමු මාස දෙක තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 564 දක්වා සියයට 13.0 කින් වර්ධනය විය. 2010 පෙබරවාරි මාසය අවසන් වන විට ආසියානු නිෂ්කාශණ සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව දළ නිල සංචිත ප්‍රමාණය පිළිවෙළින් එ.ජ.ඩොලර් මිලියන 5,408 ක් සහ එ.ජ.ඩොලර් මිලියන 5,032 ක් ලෙස වාර්තා විය. පසුගිය මාස 12 තුළ පැවැති සාමාන්‍ය ආනයන මසකට එ.ජ.ඩොලර් මිලියන 921 ක් වූ අතර, ආසියානු නිශ්කාෂණ සංගමයේ අරමුදල් රහිත දළ නිල සංචිත ප්‍රමාණය මාස 5.5 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් වේ.

**විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය - 2010 පෙබරවාරි සහ 2010 ජනවාරි - පෙබරවාරි**

| | 2009 පෙබ. එ.ජ.ඩො. මිලියන | 2010 පෙබ. එ.ජ.ඩො. මිලියන | පෙබ. වර්ධනය (සියයට) | 2009 ජනː සිට පෙබ. එ.ජ.ඩො. මිලියන | 2010 ජනː සිට පෙබ. එ.ජ.ඩො. මිලියන | ජනː සිට පෙබ. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **524.3** | **629.0** | **20.0** | **1,015.4** | **1,100.9** | **8.4** |
| කෘෂිකාර්මික | 108.6 | 169.9 | 56.4 | 209.6 | 312.4 | 49.0 |
| මෙයින් තේ | 72.3 | 109.3 | 51.1 | 133.9 | 200.1 | 49.5 |
| කාර්මික | 407.7 | 452.8 | 11.1 | 792.7 | 772.8 | -2.5 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 275.1 | 248.5 | -9.7 | 515.7 | 422.2 | -18.1 |
| ඛනිජ ද්‍රව්‍ය | 8.0 | 6.2 | -21.7 | 13.0 | 15.8 | 21.2 |
| **ආනයන** | **606.3** | **973.4** | **60.6** | **1,288.9** | **2,134.3** | **65.6** |
| පාරිභෝගික භාණ්ඩ | 143.7 | 255.5 | 77.8 | 297.8 | 489.0 | 64.2 |
| මෙයින් ආහාර හා පාන වර්ග | 96.7 | 185.9 | 92.2 | 194.7 | 346.7 | 78.0 |
| මෙයින් අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 47.1 | 69.7 | 48.1 | 103.1 | 142.4 | 38.1 |
| අන්තර් භාණ්ඩ | 289.1 | 443.3 | 53.4 | 622.9 | 1,068.4 | 71.5 |
| මෙයින් ඛනිජ තෙල් | 95.5 | 136.3 | 42.7 | 175.9 | 466.6 | 165.3 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 93.2 | 128.1 | 37.4 | 205.6 | 249.5 | 21.4 |
| ආයෝජන භාණ්ඩ | 167.5 | 261.7 | 56.3 | 350.8 | 480.8 | 37.0 |
| මෙයින් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 79.8 | 117.9 | 47.7 | 159.7 | 201.5 | 26.2 |
| මෙයින් ප්‍රවාහන උපකරණ | 20.4 | 39.3 | 92.8 | 47.1 | 92.1 | 95.5 |
| මෙයින් ගොඩනැගිලි ද්‍රව්‍ය | 49.7 | 73.6 | 48.2 | 99.1 | 134.3 | 35.6 |
| **වෙළෙඳ ශේෂය** | **-82.1** | **-344.5** | **319.8** | **-273.6** | **-1,033.4** | **277.8** |
| **සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **241.4** | **274.6** | **13.8** | **499.4** | **564.4** | **13.0** |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

## 4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 මැයි

*කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (පාදක වර්ෂය =2002) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, 2010 අප්‍රේල් මාසයේදී සියයට 5.8 දක්වා අඩු වූ අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 3.4 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. විශේෂයෙන්ම මහ කන්නයේ අස්වැන්න සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතීම ඇතුළු සැපයුම් අංශයේ ඇති වූ හිතකර වර්ධනයන් හේතුවෙන් ආර්ථිකයේ පවතින මිල පීඩනයන් යටපත් වී ඇත. නුදුරු කාලයේදී ඇතිවිය හැකි මිල පීඩනයන් අඩු කරමින් අන්තර්ජාතික වෙළෙඳපොළෙහි ප්‍රධාන භාණ්ඩ මිල ගණන් මත ඇති පීඩනයන් ද පහත මට්ටමක පවතී.*


මුදල් අංශයේ වර්ධනයන් සතුටුදායක මට්ටමක පවතී. පසුගිය වසරේ අප්‍රේල් මස සිට සංකෝචනය වූ පෞද්ගලික අංශයට ලබා දුන් ණය, වර්ධනය වීමට පටන් ගෙන ඇති අතර, 2010 මාර්තු මාසය තුළදී වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස අනුව ධන වර්ධනයක් පෙන්නුම් කරයි. මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම මෙන්ම මූල්‍ය අංශයෙහි සිදු වූ වර්ධනයන් හා එනිසා වෙළෙඳපොළ පොලී අනුපාතික අඩුවීම මීට දායක විය. පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි ක්‍රමික වර්ධනය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරයි. මේ අතර, පුළුල් මුදල් සැපයුම 2009 අවසානයේ පැවති සියයට 18.6 සිට 2010 මාර්තු මස තුළ සියයට 17.1 දක්වා අඩු විය. ඒ අනුව පුළුල් මුදල් සැපයුමේ වර්ධනය වසර ආරම්භයේදී ප්‍රකාශයට පත් කරන ලද මුදල් වැඩ සටහනේ සඳහන් ඉලක්කයන් තුළ තවදුරටත් පැවතිණ.


මෙම වර්ධනයන් සැළකිල්ලට ගනිමින් 2010 මැයි 19 වැනි දින පැවති රැස්වීමේදී මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති විවරණය 2010 ජුනි 16 වැනි දින ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## 5. 2010 මාර්තු මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය

*2009 දෙසැම්බර් මාසයේ සිට පෙන්නුම් කරන ලද ධනාත්මක වර්ධනය අඛණ්ඩව පවත්වා ගනිමින් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2010 මාර්තු මාසයේ දී තවදුරටත් වැඩිදියුණු විය. 2010 මාර්තු මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 663 දක්වා සියයට 4.8 කින් වර්ධනය වූ අතර, මේ සඳහා කාර්මික අපනයන මූලික විය. පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ ආනයන ඉහළ යාම හේතුවෙන් ආනයන වියදම ද එ.ජ.ඩොලර් මිලියන 1,091 දක්වා සියයට 6.5 කින් ඉහළ යන ලදී. ඒ අනුව, මාර්තු මාසයේ දී වෙළෙඳ ශේෂය එ.ජ.ඩොලර් මිලියන 428 දක්වා සියයට 9.3 කින් පුළුල් විය. අපනයන හා ආනයන යන දෙඅංශයම 2009 වර්ෂයට වඩා ඉහළ අගයයන් වාර්තා කළ අතර, එය මුළුමනින්ම පාහේ 2008 වර්ෂයේ අගයයන් හා ආසන්න මට්ටමක පැවැතිණි.*




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

අපනයන වර්ධනය සඳහා විශාලතම දායකත්වය කාර්මික අපනයන අංශයෙන් ලැබුණි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2010 මාර්තු මාසයේ දී කාර්මික අපනයන සියයට 5.1 කින් වර්ධනය වූ අතර, මේ සඳහා මූලික වූයේ රබර් නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, ඛනිජ නිෂ්පාදන, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ආහාර හා පාන වර්ග අපනයනවලින් ඉහළ ආදායමක් ලැබීමයි. කෙසේවෙතත්, රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 281 දක්වා සියයට 9.5 කින් පහත වැටුණු අතර, මේ සඳහා හේතු වූයේ 2009 වසරේ පළමු කාර්තුව තුළදී රෙදිපිළි සහ ඇඟළුම් අපනයනවල පැවැති යහපත් ක්‍රියාකාරිත්වය නිසා ඉහළ පදනමක් හා සැසඳීමට සිදුවීමයි.

ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තේ හා රබර් සඳහා මිල ගණන් අඛණ්ඩව ඉහළ අගයයන්වල පැවතුනද, 2010 මාර්තු මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම වර්ධනය වූයේ ඉතා සුළු වශයෙනි. සැපයුම අඩුවීම හේතුවෙන් තේ අපනයන පරිමාව සියයට 17.2 කින් අඩුවීම නිසා අපනයන ආදායම සියයට 2.7 කින් අඩු විය. කෙසේ වෙතත්, 2010 මාර්තු මාසයේ දී රබර් අපනයන පරිමාව සියයට 29.8 කින් පමණ පහත වැටුණද ඉතා ආකර්ශණීය මිල ගණන් හේතුවෙන් රබර් අපනයන ආදායම සියයට 45.8 කින් වර්ධන විය. එළවළු, කරාබුනැටි, කජු සහ තල ඇට යනාදී අපනයන සැලකිය යුතු ලෙස වර්ධනය වීම හේතුවෙන් සුළු කෘෂිකාර්මික අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 23 දක්වා සියයට 25.8 කින් ඉහළ යන ලදී.

ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් ආනයන වියදම ඉහළයාම හේතුවෙන් 2010 මාර්තු මාසයේ දී ආනයන වියදම වර්ධනය වූ අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල එ.ජ.ඩොලර් 78.29 දක්වා සියයට 67.8 කින් ඉහළ යන ලදී. 2010 මාර්තු මාසයේ දී පොහොර ආනයන වියදම ද 2009 එම මාසය හා සැසඳීමේ දී වර්ධනය වූ අතර, සැලකිය යුතු ලෙස පොහොර ආනයන පරිමාව ඉහළයාම මෙයට හේතු විය. 2010 මාර්තු මාසයේ දී ආහාර (ප්‍රධාන වශයෙන් සහල් සහ සීනි) සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ (ප්‍රධාන වශයෙන් මෝටර් රථ සහ යතුරු පැදි) සැලකිය යුතු ලෙස වර්ධනය වීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ද වර්ධනය විය. කෙසේවෙතත්, 2010 මාර්තු මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයනය වල අඩුවීමක් වාර්තා විය.

2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට 2010 පළමු මාස තුන තුළදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 891 දක්වා සියයට 14.1 කින් වර්ධනය විය. 2010 මාර්තු මාසය අවසන් වන විට ආසියානු නිශ්කාශණ සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව දළ නිල සංචිත ප්‍රමාණය පිළිවෙලින් එ.ජ.ඩොලර් මිලියන 5,294 ක් සහ එ.ජ.ඩොලර් මිලියන 5,192 ක් ලෙස වාර්තා විය. පසුගිය මාස 12 තුළ පැවැති සාමාන්‍ය ආනයන මසකට එ.ජ.ඩොලර් මිලියන 927 ක් වූ අතර, ආසියානු නිෂ්කාශණ සංගමයේ අරමුදල් රහිත දළ නිල සංචිත ප්‍රමාණය මාස 5.6 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් වේ.

මෙම කාලපරිච්ඡේදය සඳහා විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.

## විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය - 2010 මාර්තු සහ 2010 ජනවාරි - මාර්තු

| | 2009 මාර්තු එ.ජ.ඩො. මිලියන | 2010 මාර්තු එ.ජ.ඩො. මිලියන | මාර්තු වර්ධනය (සියයට) | 2009 ජනː සිට මාර්තු එ.ජ.ඩො. මිලියන | 2010 ජනː සිට මාර්තු එ.ජ.ඩො. මිලියන | ජනː සිට මාර්තු වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **632.0** | **662.7** | **4.8** | **1,647.4** | **1,763.6** | **7.1** |
| කෘෂිකාර්මික | 153.7 | 156.6 | 1.9 | 363.3 | 469.0 | 29.1 |
| මෙයින් තේ | 108.4 | 105.5 | -2.6 | 242.3 | 305.6 | 26.2 |
| කාර්මික | 471.9 | 495.9 | 5.1 | 1,264.6 | 1,268.7 | 0.3 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 310.5 | 281.0 | -9.5 | 826.2 | 703.2 | -14.9 |
| ඛනිජ ද්‍රව්‍ය | 6.4 | 10.2 | 58.1 | 19.4 | 25.9 | 33.4 |
| **ආනයන** | **1,023.6** | **1,090.5** | **6.5** | **2,312.5** | **3,224.9** | **39.5** |
| පාරිභෝගික භාණ්ඩ | 211.6 | 251.2 | 18.7 | 509.4 | 740.2 | 45.3 |
| මෙයින් ආහාර හා පාන වර්ග | 143.1 | 174.9 | 22.2 | 337.8 | 521.5 | 54.4 |
| මෙයින් අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 68.5 | 76.3 | 11.4 | 171.6 | 218.7 | 27.5 |
| අන්තර් භාණ්ඩ | 474.7 | 617.3 | 30.0 | 1,097.5 | 1,685.6 | 53.6 |
| මෙයින් ඛනිජ තෙල් | 187.4 | 285.4 | 52.3 | 363.3 | 752.0 | 107.0 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 125.8 | 117.6 | -6.5 | 331.4 | 367.2 | 10.8 |
| ආයෝජන භාණ්ඩ | 323.2 | 210.8 | -34.8 | 674.0 | 691.5 | 2.6 |
| මෙයින් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 118.9 | 83.9 | -29.5 | 278.6 | 285.4 | 2.4 |
| මෙයින් ප්‍රවාහන උපකරණ | 68.5 | 43.9 | -35.9 | 115.6 | 136.0 | 17.7 |
| මෙයින් ගොඩනැගිලි ද්‍රව්‍ය | 113.6 | 61.5 | -45.8 | 212.7 | 195.8 | -7.9 |
| **වෙළෙඳ ශේෂය** | **-391.6** | **-427.9** | **9.3** | **-665.1** | **-1,461.3** | **119.7** |
| **සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **281.3** | **326.2** | **16.0** | **780.7** | **890.6** | **14.1** |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

## 6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
## 2008, 2009 සහ 2010

(2002= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2008** | **2009** | **2010** | **2008** | **2009** | **2010** | **2008** | **2009** | **2010** | **2008** | **2009** | **2010** |
| ජනවාරි | 183.5 | 203.1 | 216.4 | 3.0 | -0.3 | 1.4 | 20.8 | 10.7 | 6.5 | 16.4 | 21.6 | 3.1 |
| පෙබරවාරි | 188.6 | 202.9 | 216.9 | 2.8 | -0.1 | 0.2 | 21.6 | 7.6 | 6.9 | 17.0 | 20.3 | 3.1 |
| මාර්තු | 191.9 | 202.0 | 214.8 | 1.7 | -0.4 | -1.0 | 23.8 | 5.3 | 6.3 | 17.7 | 18.6 | 3.2 |
| අප්‍රේල් | 195.4 | 201.0 | 212.6 | 1.8 | -0.5 | -1.0 | 25.0 | 2.9 | 5.8 | 18.7 | 16.7 | 3.4 |
| මැයි | 198.5 | 205.1 | 215.9 | 1.6 | 2.0 | 1.6 | 26.2 | 3.3 | 5.3 | 19.8 | 14.7 | 3.6 |
| ජූනි | 205.9 | 207.8 | | 3.7 | 1.3 | | 28.2 | 0.9 | | 21.0 | 12.5 | |
| ජූලි | 206.4 | 208.7 | | 0.2 | 0.4 | | 26.6 | 1.1 | | 21.9 | 10.4 | |
| අගෝස්තු | 206.3 | 208.1 | | 0.0 | -0.3 | | 24.9 | 0.9 | | 22.6 | 8.5 | |
| සැප්තැම්බර් | 207.2 | 208.6 | | 0.4 | 0.2 | | 24.3 | 0.7 | | 23.2 | 6.6 | |
| ඔක්තෝබර් | 206.6 | 209.4 | | -0.3 | 0.4 | | 20.2 | 1.4 | | 23.4 | 5.2 | |
| නොවැම්බර් | 205.2 | 211.0 | | -0.7 | 0.8 | | 16.3 | 2.8 | | 23.0 | 4.1 | |
| දෙසැම්බර් | 203.7 | 213.5 | | -0.7 | 1.2 | | 14.4 | 4.8 | | 22.6 | 3.4 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව